අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) අපට මෙසේ පවසා සිටියහ. එතුමාණෝ අවංක හා සත්යවාදියෙකු වූහ. "සැබැවින්ම ඔබ අතරින් කිසිවෙකු හෝ වේවා ඔහුගේ මැවීම ඔහුගේ මවගේ කුස තුළ දින හතළිහක් ශුක්රාණු බිඳුවක් සේ එක්කාසු කරනු ලැබේ

අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.
අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) අපට මෙසේ පවසා සිටියහ.
එතුමාණෝ අවංක හා සත්යවාදියෙකු වූහ. "සැබැවින්ම ඔබ අතරින් කිසිවෙකු හෝ වේවා ඔහුගේ මැවීම ඔහුගේ මවගේ කුස තුළ දින හතළිහක් ශුක්රාණු බිඳුවක් සේ එක්කාසු කරනු ලැබේ. පසුව එය (කූඩැල්ලෙකු සේ) ඒ හා සමාන කාලයක් එල්ලෙමින් පවතින කැටියක් බවට පත් වේ. පසුව එය ඒ හා සමාන කාලයක් මස් ගොබයක් බවට පත් වේ. පසුව ඔහු වෙත අල්ලාහ් දේවදූතයකු එවා ඔහුගේ ක්රියාව, ඔහුගේ ආයු කාලය, ඔහුගේ පෝෂණය හා ඔහු භාග්යවන්තයකු ද එසේ නැතිනම් අභාග්යවන්තයකු ද යනාදී නියමයන් හතරක් නියම කරනු ලබයි. පසුව එහි ප්රාණය පිඹිනු ලබයි. ඒ අනුව මිනිසා නිරා වාසීන්ගේ ක්රියාවන් සිදු කරයි. එය ඔහු අතර හා ඒ අතර බාහුවක පරතරයක් පිහිටන තරම් වෙයි. නමුත් පෙර නියමය ඔහු අභිබවා යයි.
ඔහු ස්වර්ගවාසීන්ගේ ක්රියාවන් සිදු කොට ස්වර්ග උයනට පිවිසෙනු ඇත. එමෙන්ම
පුද්ගලයෙක් ස්වර්ග වාසීන්ගේ ක්රියාවන් සිදු කරයි. එය ඔහු අතර හා ස්වර්ගය අතර
බාහුවක පරතරයක් පිහිටන තරම් වෙයි. නමුත් පෙර නියමය ඔහු අභිබවා යයි. එහෙයින් ඔහු නිරා වාසීන්ගේ ක්රියාවන් සිදු කොට නිරා ගින්නට පිවිසෙනු ඇත.” [صحيح] [متفق عليه]

අල්ලාහ්ගේ දූතයාණෝ අපට මෙසේ ප්රකාශ කළ බව අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. උත්තරීතර අල්ලාහ් එතුමාණන්ව සහතික කළ පරිදි එතුමාණෝ අවංක හා සත්යවාදියෙකු වූහ. එතුමාණෝ මෙසේ පැවසූහ: සැබැවින්ම ඔබ අතරින් කිසිවෙකු හෝ වේවා ඔහුගේ මැවීම එක්කාසු කරනු ලැබේ. එනම් මිනිසෙකු තම බිරිය සමග සංසර්ගයේ යෙඳුණු විටෙක, විසිරී යන ඔහුගේ ශුක්රාණු එම කාන්තාවගේ කුසෙහි දින හතළිහක කාලයක් ශුක්රාණු බිඳුවක් සේ එක්කාසු වේ. පසු ව එය ලේ "අලකා" බවට පත් වේ. එනම් එය ඝණ රුධිර කැටියකි. එය දෙවන දින හතළිහේ අදියර වේ. පසුව එය "මුළ්ආ" බවට පත් වේ. එය හපන්නට හැකි තරමින් වූ මස් ගොබයකි. එය තුන්වන හතළිස්-දින අදියර වේ. පසුව අල්ලාහ් ඔහු වෙත මලක්වරයකු එවා තුන්වන හතළිහ අවසන් වූ පසු ආත්මයක් ඒ තුළට පිඹ රෝපණය කරයි. නියමයන් හතරක් ලියන මෙන් එම මලක්වරයාට නියෝග කරනු ලැබේ. එනම්: ඔහුගේ පෝෂණයයි. එය ඔහුගේ ආයුකාලය තුළ ඔහු ලබන සුව පහසුකම්වල සීමාවේ ප්රමාණයයි. ඔහුගේ ආයුකාලය, එනම් ඔහු මෙලොවෙහි නැවතී සිටින කාල පරිච්ඡේදයයි. ඔහුගේ ක්රියාව කුමක් ද? භාග්යවන්ත ද එසේ නැතහොත් අභාග්යවන්ත ද යනුවෙන් ලියනු ලැබේ. පසු ව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දිවුරා මෙසේ පැවසූහ. "තැනැත්තෙකු ස්වර්ගවාසීන්ගේ ක්රියාව සිදු කරයි. ඔහුගේ

[illegible]

https://sunnah.global/hadeeth/si/show/65037

النجاة الخيرية
ALNAJAT CHARITY
لجنة الدعوة الإلكترونية
EDC E-Da'wah Committee